සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.08

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

De Mazenod College Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි |
| නම / பெயர் / Name: .................................... | | විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .................... | |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 3 දක්වා ප්‍රශ්නවලට ඉරි ඇඳි පදවල අර්ථයට සමීප අර්ථය ඇති පදය තෝරන්න.

## I කොටස

01. ජංගම දුරකථනය අනිසි ලෙස භාවිතයෙහි විපාක තරුණ පිරිසට <u>එත්තු ගැන්වීම</u> අපහසු ය.
    1. තේරුම්කර දීම 2. පැවසීම 3. තීරණය කිරීම 4. සිතාගැනීම

02. ශ්‍රී ලංකාව ගංගා, ඇළදොළ, කඳුවැටි, වනපෙත් ආදියෙන් <u>සමලංකෘත</u> දිවයිනකි.
    1. මනාව අලංකාර කළ 2. සමානව අලංකාර වූ 3. සිත් වශීකෘත කරන 4. සිතාගැනීම

03. ඉඳින් මූ තුමූ <u>කෘෂි වණික්</u> ආදී කටයුත්තෙක යෙදූ නම් මෙම නුවර නායක සිටු තනතුර ලැබෙති.
    1. කෘෂි කර්මාන්තය 2. කෘමීන් පාලනය
    3. ගොවිතැන් හා වෙළඳාම් 4. වෙළඳ ව්‍යාපාර

- ඉරි ඇඳි ක්‍රියාපද කුමන ක්‍රියා වර්ගයට අයත්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

04. අයියා අවවාද <u>කරද්දී</u> මල්ලී නිහඬව සිටියේය.
    1. මිශ්‍ර ක්‍රියා 2. විධි ක්‍රියා 3. අසම්භාව්‍ය ක්‍රියා 4. පූර්ව ක්‍රියා

05. අක්කා නංගි ලවා රෙදි <u>සෝදවයි</u>.
    1. පූර්ව ක්‍රියා 2. ප්‍රයෝජ්‍ය ක්‍රියා 3. මිශ්‍ර ක්‍රියා 4. විධි ක්‍රියා

06. ආකාරාදී පිළිවෙල නිවැරදිව යෙදී ඇති පද තෝරන්න.
    1. නාරම්පනාව, නාගදීපය, නාගස්තැන්න, නාවලපිටිය
    2. රාගම, රංගල, රත්නපුරය, රිකිල්ලගස්කඩ
    3. කටුගස්තොට, කෑගල්ල, කිරිල්ලවල, කුරුණෑගල
    4. තලාතුඔය, තුල්හිරිය, තලවකැලේ, තන්තිරිමලේ

07. ධීවර භාෂාවේ 'ඉයත්තුව' යනු,
    1. මුහුදු රළය 2. වාරකන් කාලයයි 3. අහස ගෙරවීමයි 4. කාලගුණයයි

08. බර්ටෝල්ට් බ්‍රෙස්ට්ගේ The Cocacian Chalk Circle නම් නාට්‍යය "හුණුවටයේ කතාව" නමින් නිෂ්පාදනය කළේ,
    1. බන්දුල ජයවර්ධන 2. එදිරිවීර සරත්චන්ද්‍ර 3. පරාක්‍රම නිරිඇල්ල 4. හෙන්රි ජයසේන

09. "කාපිරි මාඤ්ඤ" නම් ගීත රචනා වී ඇත්තේ,
    1. ඉංග්‍රීසි බසිනි 2. සිංහල බසිනි 3. දෙමළ බසිනි 4. පෘතුගීසි බසිනි

10. පෙළ පොතේ ඇති පහත සඳහන් පාඩම් උපුටා ගත් ග්‍රන්ථ පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
"දැසෙ නිල් පැහැය" ශ්‍රී පාදය වන්ද වූ හැටි, නවම් මහේ නව වළල්ල, මහධන සිටුපුත්හුගේ වස්තුව,
1. රන් තැටියක කඳුළු, මගදිගට ජනකතා, වෙරළ, සද්ධර්මරත්නාවලිය
2. මගදිගට ජනකතා, රන්තැටියක කඳුළු, සද්ධර්මරත්නාවලිය, වෙරළ
3. වෙරළ, රන් තැටියක කඳුළු, මගදිගට ජනකතා, සද්ධර්මරත්නාවලිය
4. සද්ධර්මරත්නාවලිය, වෙරළ, රන් තැටියක කඳුළු, මගදිගට ජනකතා

- **ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

11. කාව්‍ය නිර්මාණය සඳහා කවියෙකුට සතතාභ්‍යාසය අවශ්‍ය වේ.
1. සත්භාවයෙන් ක්‍රියා කිරීම 2. සියලු අදහස් විමසීම
3. සැමවිටම ඇහුම්කන් දීම 4. නිතර නිතර පුරුදු වීම

12. අභිධර්මය යන පදයෙහි ඉරි ඇඳි කොටස අයත් වන්නේ,
1. නිපාත පදවලට ය 2. විශේෂණ පදවලට ය 3. උපසර්ග පදවලට ය 4. නාම පදවලට ය

13. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා රචනා නොකරන ලද නාට්‍ය වන්නේ,
1. මනමේ නාට්‍ය 2. නරිබෑනා 3. සිංහබාහු 4. ප්‍රේමතෝ ජායතී සෝකෝ

14. කෙටි කතාවක් රචනා කිරීමේ දී හෝ රස විඳීමේ දී අපගේ සැලකිල්ලට යොමුවිය යුතු කරුණු කිහිපයකි.
A. කථා වස්තුව B. පසුබිම හා දෘෂ්ටිකෝණය
C. චරිත නිරූපණය D. භාෂාව
මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණු වන්නේ,
1. A සහ C පමණි. 2. B සහ D පමණි.
3. A, B, C සහ D පමණි. 4. A, D සහ C පමණි.

- සමනොළ හිම කඳු මුදුනේ
  සිරිපා සලකුණු ඇඳී
  ජාතිය එකමුතු කරවයි
  සම කරුණාවෙන් බැඳී......

15. මෙම පද්‍ය කොටස අයත් පද්‍ය පංතිය රචනා කරන ලද්දේ,
1. පී. බී. අල්විස් පෙරේරා මහතා 2. මහගමසේකර මහතා
3. ඩබ්ලිව්. ඩී. අබේසිංහ මහතා 4. ලක්ෂ්මන් කහටපිටිය මහතා

16. ඕෂ්ඨජ යන්නෙහි අදහස වන්නේ,
1. උගුරෙන් උපදින 2. තොල් ඇසුරෙන් උපදින
3. තලු මුහුණෙන් උපදින 4. තල්ලෙන් උපදින

- හංසයා බබළන්නේ ජලාශයන්හිදී ය
  සිංහයාගේ වික්‍රමාන්විත බව ඇතුන් මැද ය.

17. මෙම ශ්ලෝකය ඇතුළත් වන්නේ,
1. සකස් කඩ නම් පොතේ ය 2. හිතෝපදේශය නම් පොතේ ය
3. ධම්මපද ගාථාවල ය 4. ප්‍රත්‍යය ශතකය නම් ග්‍රන්ථයේ ය

18. යමක් ඇති සැටියෙන් දැක්වීම,
1. අතිශෝක්තිය යි 2. අනුප්‍රාසය යි 3. ස්වභාවෝක්තිය යි 4. කාව්‍යාලංකාරය යි

19. නූතන ළමා ගද්‍ය සාහිත්‍යයේ පුරෝගාමියා ලෙස සැලකිය හැක්කේ,
1. චාර්ලිස් ගුණතිලක මහතා ය 3. ආනන්ද රාජකරුණා මහතා ය
3. වී. ඩබ්. සමරනායක මහතා ය 4. වී. ඩී. ද ලැනරෝල් මහතා ය

20. සන්නිවේදන චන්ද්‍රිකා පිළිබඳ මූලික අදහස ඉදිරිපත් කරන ලද්දේ,
1. මහේෂ් ඉන්දික චතුරංග මහතා විසින් සම්පාදිත ලිපියක් මඟිනි
2. අභ්‍යවකාශ ගතවූ පළමු මිසිසා ලෙස ඉතිහාස ගත වූ යූරි ගගාරින්ය
3. ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් මහතා විසින් 1945 දී Wireless world සඟරාවේ පළ කරන ලද ලිපියක් මඟිනි.
4. සැමුවෙල් මෝස් විසිනි

## II කොටස

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේදී ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඔබේ කණ්ඩායම බිත්ති පුවත්පත සඳහා ඉදිරිපත් කළ තේමාව කුමක්ද? (ල 01)

ii. එම නිර්මාණය සකස් කිරීමේ දී ඔබට ලැබුණු ගුරු උපදේශ දෙකක් ලියන්න. (ල 04)

iii. බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා ඔබ කණ්ඩායම තොරතුරු ලබාගත් ක්‍රම දෙකක් ලියන්න. (ල 04)

iv. බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීමේ දී ඔබ සැළකිල්ලට ගතයුතු කරුණු තුනක් ලියන්න. (ල 03)

v. බිත්ති පුවත්පතක් සකස් කිරීමෙන් ඔබ ලබාගත් කුසලතා දෙකක් ලියන්න. (ල 04)

02. පහත සඳහන් අ, ආ, ඇ, ඈ, ඉ යන කොටස් වලින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩුවන සේ රචනයක් ලියන්න.

(අ) කෘෂි කර්මාන්තය අපේ රටේ අතීතයේ සිට ම පවතින ප්‍රධාන ජීවන ක්‍රමය යි. එය නංවාලීම ජාතික අවශ්‍යතාවකි. එහෙත් අද සිදුවී ඇත්තේ භාණ්ඩ ආනයනය මගින් ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමයි. මේ නිසා බොහෝ ගැටලුවලට ද මුහුණ දීමට සිදුවී ඇත. එසේ හෙයින් කෘෂි කර්මාන්තය දියුණු කිරීම මගින් අපේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීම වැදගත් වී ඇත. "අපේ දේශීය කෘෂිකර්මාන්තය" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ආ) ශ්‍රී ලාංකිකයෝ අතීතයේ සිට ම කලාකාමී පිරිසක් වූහ. බුදුපිළිම, සඳකඩ පහන, සීගිරි චිත්‍ර ඇම්බැක්කේ, ගඩලාදෙණියේ කැටයම් ශිල්පය, ආදිය ඔවුන්ගේ අපූරු නිර්මාණ ශක්තිය මුළු ලෝකයටම කියා පාන්නේ ය. පරිසරයේ එන විවිධ පීඩාවන්ට පමණක් නොව විවිධ ජාතීන්, ආගම්, විවිධ පුද්ගලයන්ගේ අදූරදර්ශී ක්‍රියාවලට ද ඔරොත්තු දෙමින් පවත්නා මේ ජාතික ධනය රැක ගැනීමට ක්‍රියා කිරීම අපේ යුතුකම වේ. "සුරකිමු අපේ ජාතික කලා නිර්මාණ" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඇ) අපේ ගැමි සුවඳ රැඳී ඇත්තේ ජනකවි තුළ ය. ජනකවියේ වටිනාකම රැඳී ඇත්තේ අපේ අතීත මුතුන් මිත්තන්ගේ බුද්ධිමත් බව නිසාවෙනි. එහි ඇති සරල බව රසවත් බව අව්‍යාජ බව, නිසාම සෑම කල්හි ම ජනකවි ජනයා අතර සිය හඳවතේ රැඳී ඇති, ජනප්‍රියතාවයෙන් යුතු දෙයකි. ''නොනැසී පවතින අපේ ජනකවි'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ඈ) තුරුලතාවල සුවය, සිසිලස විඳගනිමින් කුරුලු ගී හඬින් අමන්දානන්දයට පත් වෙමින් වනාන්තරය පුරා ඇවිද ගියෙමි. හදිසියේ පය ලිස්සා මා ඇඳ වැටුණේ මට තනිව ගොඩට ඒමට නොහැකි තරමේ ගැඹුරු වළකට ය. සිදුවූ අකරතැබ්බයෙන් මිදෙන්නට ක්‍රමයක් සිතමින් තැතිගත් සිතින් සිටි මට කොළ සෙලවෙන හඬක් ඇසිණි. මා වුවමනාවෙන් කන්දීගෙන සිටියේ කිසියම් පිහිටක් ලබා ගත හැකි වේ යැයි අපේක්ෂාවෙනි, මේ රචනයෙහි ඉතිරි කොටස නිර්මාණය කරන්න. මාතෘකාවක් ද යොදන්න.

(ඉ) වර්තමාන සමාජයේ මිනිසුන් හට රෝග රැසකට ප්‍රබලව සාධනය වී ඇත්තේ කැළි කසළ නිසියාකාරව බැහැර නොකිරීම නිසා ඇතිවී ඇති බෝවන රෝගයන් ය. එසේම ජනතාව අපහසුතාවයට පත්වන්නේ තැනින් තැන කුණු සහ විවිධ අපද්‍රව්‍ය දමාගොස් ඇති බැවිනි. "කුණු ගොඩකි - ලෙඩ රැසකි" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 14)

03. පහත දැක්වෙන ජේදයේ වචන 25 - 35 ත් අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ අග වචන සංඛ්‍යාව ලියන්න.

විවිධ ශෛලීන් අනුව චිත්‍ර නිර්මාණය කරන්නට පිකාසෝ පෙලඹුණි. ඔහුගේ චිත්‍ර නොයෙක් අවධිවලට වෙන් කොට ඇත්තේ එම ශෛලීන්ට අනුව ය. තමා විසින් අත්හැර දැමූ ශෛලියක් නැවත කිසි දිනක ඔහු භාවිතා කලේ නැත. මේ නිසා ගෙවී ගිය අවධියේ පිකාසෝ දසවාරයක් පමණ චිත්‍ර කලා ජීවිතයේ පුනරුත්පත්තිය ලබා ඇතැයි විචාරයෝ පවසති. ස්වීය නිර්මාණයන් ඉතා ඉහළ මිලට විකිණෙන අවස්ථා සියැසින් දැක ගැනීමේ භාග්‍ය ඔහුට උදාවිය. පිකාසෝගේ මුල් යුගයේ විග්‍රයක් රුපියල් තිස්පන් ලක්ෂයකට අලෙවි විය.

(ලකුණු 10)

- පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

04. සිය ආචාර්ය උපාධිය සඳහා හෝකින් විසින් තෝරාගනු ලැබුවේ සාධාරණ සාපේක්ෂතාවාදය හා විශ්ව න්‍යාය යන විෂය ක්ෂේත්‍රයි. මේ අවධිය වන විට හෝකින් සිය රෝගය නිසා නිතර පීඩා විඳි අතර ඇවිදීමේදී පවා ඔහුට දැනුණේ විශාල අපහසුතාවයකි. මේ අභියෝග මධ්‍යයේ වුවද 1966 දී ඔහු සිය ආචාර්ය උපාධිය දිනා ගත්තේ ය. ඒ ව්‍යවහාරික ගණිතය හා න්‍යායාත්මක භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රය යටතේ "සාධාරණ සාපේක්ෂතාවාදය හා විශ්ව න්‍යාය" පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත විද්වතකු ලෙස ය. 'කාල අවකාශයේ අපූර්වතා හා ජ්‍යාමිතිය' නම් වූ හෝකින්ගේ එම පර්යේෂණ කෘතියට එම වර්ෂයේ ඇඩම්ස් ත්‍යාගයද හිමිවිය.

i. හෝකින් සිය ආචාර්ය උපාධිය සඳහා තෝරාගත් විෂය ක්ෂේත්‍ර දෙක කුමක්ද?
ii. ආචාර්ය උපාධිය සඳහා වූ අධ්‍යයන කටයුතුවල නියැළීම හෝකින්ට අභියෝගයක් වුයේ ඇයි?
iii. ආචාර්ය උපාධිය සඳහා හෝකින් ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධය කුමක්ද?
iv. හෝකින්ට ඇඩම්ස් ත්‍යාගය හිමිවුයේ කුමක් සඳහාද?
v. හෝකින් විශේෂඥ දැනුමක් සහිත විද්වතකු බවට පත්වුයේ කිනම් විෂයන් සම්බන්ධයෙන්ද?

(ලකුණු 10)

05. මහානාම විද්‍යාලයේ 2023 වර්ෂාවසාන අධ්‍යාපනික සැණකෙළියේ එක් විශේෂාංගයක් ලෙස පොත් ප්‍රදර්ශනයක් සහ අලෙවි සැලක් පැවැත්වීමට අදහස් කරයි. මේ සඳහා පොත්පත් ලබාගැනීම ඉතා වැදගත් කාර්යයකි. මේ කටයුත්ත සඳහා දායකත්වය ලබාදෙන ලෙස ඉල්ලමින් මරදාන එස්. ගොඩගේ පොත් ප්‍රකාශන ආයතනයට යවන ලිපියක් ලියන්න. ඔබ මහානාම විද්‍යාලයේ සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 10)

06. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මඟදිගට ජනකතා කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද? (ලකුණු 2)
ii. සාහිත්‍යය යනු භාෂාව මාධ්‍ය කොට හැඟීම් ප්‍රබලාකාරයෙන් දැන්වීම සඳහා මානවයා ගොඩනගා ගත් මාර්ගයකි. ඒ අනුව සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද 3 නම් කරන්න. (ලකුණු 3)
iii. භාෂා ශක්‍යතාවන් වර්ධනය කරගැනීමට නම් මුලින්ම කළ යුත්තේ කුමක්ද? (ලකුණු 1)
iv. කිසියම් දේශනයක් හෝ ඉදිරිපත් කිරීමක් පරිගණකය ආධාරයෙන් සිදු කිරීමේ දී බහුලව යොදාගන්නා ජනප්‍රිය මෘදුකාංගය කුමක්ද? (ලකුණු 2)
v. සුළඟ නැමැති අකීකරු බලවේගය මෙල්ල කොට ගැනීමේ අගනා තාක්ෂණයක් මසුන් මරන්නා සතු බව හෙළිවන්නේ කුමකින්ද? (ලකුණු 2)

(ලකුණු 10)